www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දියාව තුල බුෂ්ට එරෙහි විරෝධතා: අධිරාජ්‍යවාදයට එරෙහි සටන සඳහා ජාත්‍යන්තර සමාජවාදී මූලෝපායක්

**Protests against Bush in India: For an international socialist strategy to fight imperialism**

**කර්තෘ මන්ඩලය විසිනි**
**2006 මාර්තු 01**

*ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ආධාරකරුවන් මෙම ප්‍රකාශනය එක්සත් ජනපද ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ්ගේ සංචාරයට එරෙහිව ඉන්දියාවේ විරෝධතාවන්හි දී බෙදා හරිනු ඇත. ඉන්දියාව තුල අපගේ ආධාරකරුවන් හා පාඨකයන්ගෙන් අප ඉල්ලා සිටින්නේ මෙම ප්‍රකාශනය වෙබ් අඩවියෙන් ලබා ගෙන හැකි තාක් පුලුල් ලෙස බෙදා හරින ලෙස යි.*

ලක්ෂ ගනන් කම්කරුවන්, ගොවීන්, සිසුන් හා අනෙකුත් තරුනයන් ඉන්දියාව පුරා පැවැත්වෙන පෙලපාලි හා රැස්වීම්වලට ඉදිරි දිනවල දී සහභාගි වනු ඇති අතර ඔවුන් ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ්ගේ සංචාරයටත් ඉන්දීය ධනේශ්වරය එක්සත් ජනපදය සමග ඇටවීමට යන "භූගෝලීය" හවුලටත් එරෙහිව විරෝධතා දක්වනු ඇත. ජෝර්ජ් බුෂ්, මධ්‍යම ආසියාවේත් මැද පෙරදිගත් තෙල් සම්පත් මත එක්සත් ජනපද ආධිපත්‍යය පිහිටුවා ගැනීමේ අරමුනෙන් පසු ගිය පස් වසර තුල යටත් කර ගැනීමේ යුද්ධ දෙකක් ගෙන ගිය හා ඉරානය හෝ සිරියාව එහි ඊලඟ ඉලක්කය බවට පත් කර ගැනීමට දැන් තර්ජනය කරමින් සිටින කොල්ලකාරී බල තන්ත්‍රයක මූලිකයා ලෙස විරෝධතාකරුවන් විසින් නිවැරදිව හඳුනා ගනු ලැබ සිටිති.

ඉන්දියාව, ඉරානයෙන් හා සිරියාවෙන් බලශක්තිය මිලට ගැනීම වැලැක්වීමෙහි ද, ඉරානයට එරෙහිව ජාත්‍යන්තර කල්ලියක කොටස්කරුවෙකු බවට ඉන්දියාව පත් කර ගැනීමට එරෙහිව ද, බුෂ් පරිපාලනයෙන් කෙරෙන බලපෑම් ඉන්දියාවේ එක්සත් ප්‍රගතිශීලී සන්ධාන (යූපීඒ) ආන්ඩුවේ සන්තාපයට හේතු වෙයි.

බුෂ් හා ඉන්දීය අගමැති මන්මෝහන් සිං, ලෝකයේ ලොකු ම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් දෙක අතර මල්පල ගැන්වෙමින් තිබෙන අලුත් මිත්‍රත්වය ගැන පල්හෑලි වගුරමින් සිටිනවාට සැකයක් නැත. යථාර්ථයේ දී එක්සත් ජනපදයට හා ඉන්දියාවට පොදු දෙය වන්නේ ඔවුන්ගේ පාලන තන්ත්‍රයන් ගෙන යන, සමාජ ජීවිතයේ සියලු පැතිකඩවල් මත එල්ල කෙරෙන වෙලඳ පොලේ නිර්බාධිත ආධිපත්‍යයේ ද පුද්ගලීකරනයේ නව ලිබරල් ක්‍රියා මාර්ගයේ හා කැබලි කිරීමේ ප්‍රතිඵල වසයෙන් ඇති කෙරුනු සමාජ අසමානතාවේ හා ආර්ථික අනාරක්ෂිත භාවයේ ද සුවිශේෂී වර්ධනය යි. ප්‍රජාතාන්ත්‍රීය අයිතීන්ට වැඩි වැඩියෙන් එල්ල කෙරෙන රාජ්‍ය ප්‍රහාරයන් ද දෙරටෙහි දී ම ඔවහු අත් විඳිති.

බුෂ් පරිපාලනය හා යූපීඒ තන්ත්‍රය ඇටවීමට යන ඉන්දු-ඇමරිකානු මූලෝපායික හවුල්කාරිත්වය යොමු කර ඇත්තේ ඉන්දියාවේ, උතුරු ඇමරිකාවේ හා ලෝකය පුරා ම කම්කරු ජනතාවගේ අවශ්‍යතාවන්ට එරෙහිව ය.

එක්සත් ජනපදය ආක්‍රමනශීලිව ඉන්දියාවට ඇලුම් කරන්නේ ආසියාවේ ප්‍රමුඛ බලවතා ලෙස එක්සත් ජනපදයේ තත්වයට චීනය තර්ජනයක් වීම වැලැක්වීමේ එහි උත්සාහයේ කඩඇනය බවට එය පත් කර ගැනීමේ දෘෂ්ටියෙනි.

බුෂ් පරිපාලනය එහි ඉන්දීය ප්‍රතිපත්තියෙහි චීන විරෝධී තල්ලුව සඟවන්නේ නැත.

පසු ගිය සියවසේ ලෝක යුද්ධ දෙකක් සඳහා වේදිකාව සැකසූ භූදේශපාලනික මාරු වීම්වල දී ලෝකයේ වඩාත් ම ගතික කාර්මික බලවතුන් ලෙස එක්සත් ජනපදය හා ජර්මනිය 19 වන සියවස අග භාගයේ මතු වී ආ ආකාරයට 21 වන සියවස ආරම්භයේ දී චීනය හා ඉන්දියාවේ නැගීමගැන එක්සත් ජනපද බුද්ධි අංශ හා භූදේශපාලනික විශ්ලේෂකයන් නිතිපතා සැසඳුම් කරන බව ෆිනෑන්ෂල් ටයිම්ස් පත්‍රය වාර්තා කරයි.

සිය භූගෝලීය ආරක්ෂක මූලෝපායට අදාලව ඉන්දියාව සන්නද්ධ කර ගැනීමට එක්සත් ජනපදය සුපරීක්ෂාකාරී වන අතර ඉන්දීය බල තන්ත්‍රය, ඉන්දියානු සාගර කලාපයේ ද, දකුනු ආසියාවේ ද අධිකාරවත්

බලයක් ලෙසත් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලයෙහි ස්ථිර සාමාජිකත්වයත්, න්‍යෂ්ටික අවි සතු රාජ්‍යයක් ලෙසත් පිලිගැනෙන ලෝක දේශපාලනයේ ප්‍රධාන පාර්ශ්වකරුවෙකු ලෙස ඉන්දියාවේ පිලිගැනීම සඳහාත් වොෂින්ටනයේ සහාය ලබා ගැනීමට දැඩි උනන්දුවක් දක්වයි.

යෝජිත ඉන්දු-එක්සත් ජනපද හවුල්කාරිත්වයේ දෙවන අරමුන ගෝලීය තොරතුරු තාක්ෂනය, ව්‍යාපාර දත්ත සැකසීම, විද්‍යාත්මක පර්යේෂන හා කාර්මික නිෂ්පාදනයේ ලාභ ශ්‍රම අඩවියක් බවට ඉන්දියාව පත් කර ගැනීම කරා ඉදිරියට තල්ලු වීම යි. ලෝක ධනේශ්වර ආර්ථිකය තුලට ඉන්දියාව ඒකාග්‍ර කල යුතු වේගය පිලිබඳව එක්සත් ජනපදය හා ඉන්දීය මහා ව්‍යාපාරිකයා අතර වෙනස්කම් පැවතිය ද ඔවුහු, මිල සහනාධාර හා සහන අහෝසි කිරීමටත්, ඉන්දියානුවන් සියයට හැටක් යෙදී සිටින කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ කෘෂි ව්‍යාපාර විවෘත කිරීමටත්, පොදු යටිතල පහසුකම් ගොඩ නැගීමේ දී ව්‍යාපාරයන්ට ප්‍රධාන වැඩි කාර්ය භාරයක් පැවරීමටත් දොට්ට දැමීම් ද කම්හල් වසා දැමීම් ද රැකියාවන් හකුලුවා ලීම් ද පහසු කරවන පරිදි කම්කරු නීති යලි සකස් කිරීමටත් එකඟ වෙති.

වෙනත් වචනවලින් කිව හොත් එක්සත් ජනපද හා ඉන්දීය ප්‍රාග්ධනය, ගොවීන් සියදිවි නසා ගැනීමේ ප්‍රපංචයෙන් ප්‍රකාශයට පත් වූ ඉන්දියාවේ ගම්බද උග්‍ර සමාජ ව්‍යසනය නිර්මානය කර තිබෙන හා නගරවල විරැකියාවේ වර්ධනය උත්සන්න කල එම ප්‍රතිපත්තීන්ට ම එකඟත්වය පල කරයි.

ඉන්දියාවේ රැඳී සිටින දෙදින තුල බුෂ් වසර පුරා පැතිර යනු ඇති මහජන විරෝධතාවන් යෝජිත ඉන්දීය-එක්සත් ජනපද මූලෝපායික හවුල මෙන් ම වෛෂයිකව මතු කරන්නේ වැදගත් ප්‍රශ්නයකි. ඒ අධිරාජ්‍යවාදයටත්, ප්‍රාග්ධනයේ භූගෝලීකෘත ආක්‍රමනයටත් එරෙහි ව සාර්ථක ව්‍යාපාරයක් ගොඩ නැගිය හැක්කේ කුමන පදනමක ද යන්න යි.

ආරම්භයේ දී ම කිව යුත්තේ බුෂ් විරෝධතාවන්හි නායකත්වය ගෙන සිටින්නවුන්, එනම් ඉන්දීය මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂයේ (සීපීඅයිඑම්) ස්ටැලින්වාදීන් ද ඔවුන්ගේ වාම පෙරමුනු හවුල්කාරයන් හා වෘත්තීය සමිති ද ධනවාදයට එරෙහිව ඉන්දියාව තුල හා ලොව පුරා කම්කරු පන්තිය දේශපාලනිකව බලමුලු ගැන්වීමට දැඩි ලෙස විරුද්ධ වන බව යි.

ඊට වෙනස් ලෙස වාම පෙරමුන හා වෘත්තීය සමිති බුෂ්ට එරෙහි විරෝධතාවන් යොදා ගන්නේ මහා බලවතුන් අතර භූදේශපාලනික හා ආර්ථික වාසි සඳහා වන අරගලයේ දී ඉන්දියාව වෙනත් තැනකට ගෙන ඒම සඳහා ආන්ඩුවට බල කිරීමටත් තමන් යූපීඒ තන්ත්‍රයට ලබා දෙන සහයෝගය වසන් කරන ආවරනයක් සපයා ගැනීම සඳහාත් ය. වාම පෙරමුන, එහි පූර්වගාමී භාරතීය ජනතා පක්ෂයේ (බීජේපී) නායකත්වයෙන් යුත් ජාතික ප්‍රජාතාන්ත්‍රීය සන්ධාන ආන්ඩුවේ ලිබරල්වාදී ප්‍රතිසංස්කරන හා එක්සත් ජනපද හිතවාදී නැඹුරුව 21 මසක් වයසැති යූපීඒ ආන්ඩුව යටතේ වේගවත් වී ඇතැයි නො වලහා පිලිගනියි. එහෙත් හින්දු අධිපතිවාදී බීජේපීය යලි බලයට පැන ගැනීම වැලැක්වීමේ එක ම මාධ්‍යය ඉන්දීය ධනේශ්වරයේ සාම්ප්‍රදායික ආන්ඩු පක්ෂය වන කොන්ග්‍රසය ආධිපත්‍යය දරන යූපීඒ සභාගය බව ප්‍රකාශ කරන ඔවුහු එය බලයේ තබා ගත යුතු බව අවධාරනය කරති.

බීජේපීය කම්කරු පන්තියේ අධම සතුරෙකු බවට කිසිදු ප්‍රශ්නයක් නැත. එහෙත් නිදහසෙන් පසු ඉන්දීය ධනේශ්වරයේ ජාතික ආර්ථික සංවර්ධන ව්‍යාපෘතිය මුහුදුබත් වීම, දශක ගනනාවක් තිස්සේ ඉන්දීය දේශපාලනය තුල ආන්තික බලවේගයක්ව පැවති හින්දු දක්ෂිනාංශයේ මැතිවරන ජයග්‍රහනය අනිවාර්ය කලේ නැත.

බීජේපීය හා කුලවාදී පක්ෂ සමූහයක් 1980 ගනන්වල හා 1990 ගනන්වල දේශපාලන පොර පිටියේ ප්‍රධාන තරගකරුවන් බවට පත් වීමේ වගකීම කෙලින් ම පැවරෙන්නේ දශක ගනනාවක් තිස්සේ කම්කරු පන්තිය පාර්ලිමේන්තුවාදී හා වෘත්තීය සමිති අරගලවල ඉදිරි දර්ශනයක හිර කොට තැබූ සීපීඅයිඑම් හා ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය (සීපීඅයි) වෙත ය. අධිරාජ්‍යවාදයේ ගැත්තන් හා වැඩවසම් ප්‍රතිගාමීන්ට එරෙහිව සහාය ලබා දීමට සුදුසු ඉන්දීය ධනේශ්වරයේ ප්‍රගතිශීලී කඳවුර නියෝජනය කරන්නේ කුමන පක්ෂය හෝ පක්ෂ ද යන කාරනාව මත ස්ටැලින්වාදී පක්ෂ දෙක විටින් විට වෙනත් ස්ථාවරයන් ට පැමිනුනු අතර එම දෙපක්ෂය ම ඉන්දීය ධනේශ්වරයට හා ධනේශ්වර පර්යායට එරෙහිව පීඩිත මහජනතාවගේ නායකයා ලෙස කම්කරු පන්තිය තෙමේ පෙනී නො සිටිය යුතු බව අවධාරනය කලේ ය.

එම දෘෂ්ටියේ ම පිහිටා සිටිමින් සීපීඅයිඑම් හා සීපීඅයි පක්ෂ අද අවධාරනය කරන්නේ ආන්ඩුව සමාජ ප්‍රතිගමනයේ න්‍යාය පත්‍රයකට හා එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සමග මූලෝපායික හවුලක් අටවා ගැනීමෙහි ලා කැප වී සිටින බැවින් වඩාත් ප්‍රතිගාමී බීජේපී තන්ත්‍රයේ මග ඇවිරීම සඳහා එය බලයේ රැඳී සිටිය යුතු බව යි. සිදුවීම් මගින් යලි යලිත් පෙන්නුම් කර ඇත්තේ ඉන්දියාවේ පීඩිතයන් අතර පැතිර පවතින ඉමහත් සමාජ විරසකය හා එක්සත් ජනපදය හෝ වෙනත් අධිරාජ්‍යවාදී බලවතුන් සමග සන්ධානයන් ද, යෝධ මිලිටරීකරනය ද, ඉන්දියාවේ ලාභ ශ්‍රම සංචිතය නිර්දය ලෙස සූරා කෑම ද තුලින් ඉන්දියාව ලෝක බලවතෙකු කිරීමේ ඉන්දීය ධනේශ්වරයේ ධාවනයට

එරෙහිව කම්කරු පන්තියේ නායකත්වයෙන් යුත් දේශපාලන ප්‍රතිප්‍රහාරයක ශක්‍යතාව යි.

සියලු වෘත්තීය සමිති හා වැඩ වර්ජන තහනම් කල යුතු ය යි කැඳවුම් කල නිව් ඉන්ඩියන් එක්ස්ප්‍රස් පුවත්පත් කතුවැකිය ආදර්ශමත් කල පරිදි, ඉන්දීය පාලක පන්තිය, යූපීඒ ආන්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තීන්ට එරෙහිව පසු ගිය සැප්තැම්බරයේ පැවැත්වූ එක්දින වැඩ වර්ජනයට ලැබුනු මහජන සහයෝගයෙන්, කම්පනයට පත්ව සිටියි.

එහෙත්, ඉතා මෑතක දී රටේ ගුවන් තොටුපලවල් පුද්ගලීකරනයට එරෙහිව පැන නැගි සටන්කාමී වැඩ වර්ජනයට ඇබය ගැසීමට වෘත්තීය සමිති සමග එක් වෙමින් වාම පෙරමුන, ක්‍රමානුකූලව පන්ති අරගලය මැඩ පැවැත්වීම මගින් යූපීඒ තන්ත්‍රයේ පැවැත්ම සහතික කලේ ය. බටහිර බෙංගාලයේ ප්‍රාන්ත ආන්ඩුව පිහිටුවා තිබෙන වාම පෙරමුන අනුගමනය කරමින් සිටින්නේ ද යූපීඒ හා එහි පූර්වගාමී එන්ඩීඒ ආන්ඩුවල එම ආර්ථික ''ප්‍රතිසංස්කරන'' වැඩ පිලිවෙල ම ය.

ප්‍රතිගාමී යූපීඒ ආන්ඩුවට කම්කරු පන්තිය බැඳ තැබීම මගින් වාම පෙරමුන ඉඩ සලසන්නේ ධනේශ්වරයේ නව ලිබරල් න්‍යාය පත්‍රය ක්‍රියාවට නැගීමට පමනක් නො ව, යූපීඒ හි සමාජ ප්‍රතිගමනයේ ප්‍රතිපත්තීන් කෙරෙහි පවතින මහජන විරෝධය ගසා කා තර වීමට බීජේපීය ඇතුලු අනෙකුත් අපකීර්තියට පත් වාර්ගික හා කුලවාදී පක්ෂවලට කොන්දේසි සකසා දීමට ය.

යූපීඒය බුෂ් පරිපාලනය වැලඳ ගැනීමට එරෙහි ව්‍යාපාරය තුල ද, වාම පෙරමුන හා වෘත්තීය සමිති ගනන් බලන්නේ, කම්කරු පන්තිය හා අධිරාජ්‍ය විරෝධී මහජන මතය පෙර සේ ම, ධනේශ්වරයට ගැට ගැසීමට යි. ඉන්දීය ආන්ඩුව ''ස්වාධීන විදේශ පිලිවෙතක්'' අනුගමනය කල යුතු ය යන ඉල්ලීම සමග ඔවුන් පිවිසෙන්නේ හිටපු අගමැතිවරයෙකු වන වී.පී. සිං, සමාජවාදී පක්ෂය වැනි ප්‍රාදේශීයවාදී ද කුලවාදී ද ධනපති කොටස් හා එක්සත් ජනපදය සමග යෝජිත සන්ධානය, ඉන්දීය ධනේශ්වරයේ ම කොල්ලකාරී අභිලාෂයන් පෙරට ගෙන යාම සඳහා එයට අවශ්‍ය ලෙස කටයුතු කිරීමේ නිදහසට අවහිරයක් වේ ය යි බියට පත්, න්‍යෂ්ටික හා හමුදා ආරක්ෂක සංස්ථාපිතයේ කොටස් සමග එක ම මාවතකට ය.

චීනය හා රුසියාව සමග ත්‍රෛ පාක්ෂික සන්ධානයක් ඇටවීම සඳහා ඉන්දියාවට කැඳවුම් කල ප්‍රන්ස ජනාධිපති ජැක් චිරාක්ගේ බහුධ්‍රැවීය ලෝකයක් පිලිබඳ සංකල්පය වෙනුවෙන් පෙනී සිටිමින් සීපීඅයිඑම් එය එක එල්ලේ ම යෝජිත ඉන්දු-එක්සත් ජනපද සන්ධානයට හරස්ව පිහිටුවයි.

ඒ සමානව ම සීපීඅයිඑම් හා වාම පෙරමුන සීතල යුද්ධ කාල වකවානුව තුල ඉන්දියාවේ නොබැඳි පිලිවෙත ඉන්දියාව ගොඩ නැගීමේ ප්‍රගතිශීලී උරුමය ලෙස පෙන්වා දෙයි. (සීපීඅයිඑම් හි පක්ෂ ක්‍රියා මාර්ගය කියා සිටින්නේ නොබැඳි පිලිවෙත ''රටේ අවශ්‍යතාවන්ට හොඳින් සේවය කර තිබෙන'' බව යි.)

යථාර්ථයේ දී ''නොබැඳි පිලිවෙත'' ඉන්දියානු ධනේශ්වරයේ උපකරනයක් විය. ඔවුන් සෝවියට් සංගමය වෙත නැඹුරු වූ අතර ජාතික ආර්ථික පරිපාලනය හා ආනයන ආදේශන තුලින්, සාපේක්ෂව අන්තර් ජාතික සංගතයන්ගෙන් ස්වාධීන වූ කාර්මික ආර්ථිකයක් වර්ධනය කිරීමේ යෙදී සිටියේ ය. එසේ ම, නොබැඳි පිලිවෙත කම්කරු පන්තියට එරෙහි අවියක් ද විය. එය, විවිධාකාර අධිරාජ්‍ය විරෝධී අරගලයන්ට බොහෝ කොට ම පුරසාරම් සහගත සහාය දැක්වීම් තුලින්, ඉන්දීය ධනේශ්වරයේ හා රාජ්‍යයේ ප්‍රගතිශීලී ස්වභාවය පිලිබඳ මිථ්‍යාවන් වැපිරීමට ක්‍රමානුකූලව යොදා ගනු ලැබුනි. මොස්කෝව සමග යහපත් සබඳතාවන් පවත්වා ගැනීම මගින් කොමියුනිස්ට් පක්ෂයේ මනා හැසිරීම තව දුරටත් සහතික වනු ඇතැයි ජේ. නේරු ද ඉන්දිරා ගාන්ධි ද ගනන් බැලූහ. කොන්ග්‍රස් පක්ෂයට සීපීඅයිය පිදූ සහාය කොතෙක් නින්දිත වී ද යත් නායකත්වයේ කොටසක් කැඩී වෙන් වී සීපීඅයිඑම් පිහිටුවා ගත්හ. එහෙත් ඔවුන් එසේ කලේ මුලුමනින් ම ජාතිකවාදී පදනමක වන අතර ම, සීපීඅයිඑම් සිය ඉතිහාසය පුරා සීපීඅයිහි මූලික පිලිවෙත් සියල්ල ම අනුගමනය කලහ. එනම් තනි රටේ සමාජවාදය යන ස්ටැලින්වාදී ධර්මතාවට ද සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය තුල ස්ටැලින්ගේ නායකත්වය යටතේ කම්කරු පන්තිය වෙතින් බලය පැහැර ගත් වරප්‍රසාදිත නිලධරයට ද සහාය දැක්වීමඃ අධිරාජ්‍යවාදයට එරෙහි අරගලයේ දී ඉන්දියානු ධනේශ්වරයේ වැදගත් කොටස් ප්‍රගතිශීලී ක්‍රියා කලාපයක් ඉටු කර ඇතැයි ද ඉටු කරනු ඇතැයි ද කියා සිටීමඃ කොන්ග්‍රස් නායකත්වය විසින් ගෙන ගිය අධිරාජ්‍ය විරෝධී අරගලය ගබ්සා වීමේ ප්‍රතිඵලය ලෙස 1947 දී උපත ලද ඉන්දියානු රාජ්‍යය ද, උපමහාද්වීපය බෙදා වෙන් කිරීම ජනතාවගේ ජයග්‍රහනයක් ලෙස ආරක්ෂා කල යුතු ය යි ද එය අද දින අධිරාජ්‍යවාදයට විරෝධය පෑමේ කේන්ද්‍රීය ලක්ෂ්‍යය කර ගත යුතු ය යි ද අවධාරනය කිරීම.

ලියොන් ට්‍රොට්ස්කි විසින් ආරම්භ කරන ලද සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂය වන හතර වන ජාත්‍යන්තරය හා ලෝක සමාජවාදී වෙබ් අඩවිය පෙනී සිටින්නේ මුලුමනින් ම වෙනස් වූ ක්‍රියා මාර්ගයකට ය.

ධනපති භූගෝලීයකරනයේ සමාජමය ප්‍රතිගමනයේ බලපෑමටත් අධිරාජ්‍යවාදයටත් යන දෙකට ම විරෝධය

පැමේ දී ඉන්දියානු කම්කරුවන්ගේ අව්‍යාජ මිතුරන් වන්නේ උතුරු ඇමරිකාවේ ද ලොව පුරා ද විසිරී සිටින කම්කරුවන් ය.

ඉන්දියානු කම්කරුවන් ස්වාධීන දේශපාලන බලවේගයක් ලෙස තෙමේ ම බලමුලු ගැන්වෙමින් ධනේශ්වර විරෝධී ක්‍රියා මාර්ගයකට පීඩිත මහජනතාවන් රැලි කර ගත යුතු ය. කුල ක්‍රමයේ මර්දනයත් ඉඩම් හිමි ආධිපත්‍යය හා ඉන්දියාවේ කල් පසු වූ ධනේශ්වර සංවර්ධනය හා අධිරාජ්‍යවාදී යටත් කිරීම වැනි අනෙකුත් දායාදයනුත් අවසන් වනු ඇත්තේ ජාත්‍යන්තර සමාජවාදී විප්ලවයේ අතුරු ඵලයක් වසයෙන් පමනකි.

එක්සත් ජනපද අධිරාජ්‍යවාදය වර්තමානයේ වඩාත් බලාත්කාරී හා ආක්‍රමනකාරී අධිරාජ්‍යවාදී බලය වන අතර අධිරාජ්‍යවාදයට එරෙහි අව්‍යාජ අරගලයක් සඳහා සමස්තයක් ලෙස ධනවාදී පද්ධතියට ම හා එය ඓතිහාසිකව මුල් බැස ගත් යල් පිනූ ජාතික රාජ්‍ය පද්ධතියට ම එරෙහි අරගලයක් අවශ්‍ය කෙරේ.

මෙම ක්‍රියා මාර්ගයට සහාය දක්වන සියල්ලන් ම, ජාත්‍යන්තර සමාජවාදී ඉදිරි දර්ශනයක් මත ලෝක කම්කරු ව්‍යාපාරයේ දේශපාලන හා සංවිධානමය පුනර්ජීවනයක හී තුඩ බවට *ලෝ.ස.වෙ.* අඩවිය පත් කර ගැනීමට වෙහෙසිය යුතු ය.

© www.wsws.org